සටන් විරාම ගිවිසුම දැන් නිකම්ම නිකම් ලියවිල්ලක් විතරයි. ඒ ගැන කව්රුත් කුලප්පු විය යුතු නැත. සටන් විරාමය තිබුණා කියලා රජය කොටින්ට පහර දෙන්නේ නැද්ද? මේ හෙළ උරුමය දැන් අලුතින්ම ඉදිරිපත් කරන තර්කයකි. නමුත් හෙළ උරුමය මීට පෙර මෙවැනි දේවල් ප්‍රකාශ කළේ නැත. ඔවුන් සම්පූර්ණයෙන්ම පෙනී සිටියේ ගිවිසුම අහෝසි කිරීමටය. නෝර්වේ අය රටින් ඉවත් කිරීමටය. පසුගියදා ආණ්ඩුවේ ඇමැති ධූරයක් ලබාගත් සැනින් වරප්‍රසාද වලට හෙළ උරුමය සිය ප්‍රතිපත්තිය පාවාදෙන බවට කිසියම් අයකුට හැඟී යෑමට බැරි නැත. හෙළ උරුමයේ ක්‍රියාකලාපය දෙස බලන කළ එවැනි හැඟීමක් යම් අයෙකු තුළ ඇතිවීමද එතරම් වරදක් නැත.

අද රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන්නේ මහින්ද රාජපක්ෂ හා ප්‍රභාකරන් අතර හොර ගිවිසුමක් ඇති බවය. ඊට පදනම වී ඇත්තේ ශ්‍රීපති සූරියආරච්චි හිටපු ඇමැතිවරයා කරන ලද ප්‍රකාශයකි. ''පසුගිය ජනාධිපතිවරණයේදී උතුරේ ජන්ද වැළැක්වීමට මහින්ද ප්‍රභා අතර රහස් ගිවිසුමක් ඇති වූ බව ඔහු පසුගියදා ඇමැතිධුරයෙන් ඉවත් කිරීමෙන් අනතුරුව කියා සිටියහ.

එහි සත්‍ය අසත්‍යතාවය පිළිබඳව අප තවමත් නිශ්චිත වශයෙන් නොදනිමු. මන්ද, ඒ ගැන සැබෑ තොරතුරු ජනතාව අතරට පත්වී නැති බැවිනි. මෙයට පසුගියදා පාර්ලිමේන්තුවේදී අගමැති රත්නසිරි වික්‍රමනායක මහතා පිළිතුරු සපයමින් කියා සිටියේ මහින්ද හා ප්‍රභාකරන් අතර කිසිදු ගිවිසුමක් නැති බවය. එවැනි දෙයක් තිබෙනවා නම්, එය ප්‍රකාශ කළ අයගෙන්ම අසා ගන්නා ලෙස අගමැතිවරයා කියා සිටියහ.

අප දන්නා ආකාරයට නම්, ''මහින්ද - ප්‍රභා'' අතර ගිවිසුමක් නැත. නමුත් ''රනිල් - ප්‍රභා'' අතර ගිවිසුමක් තිබු බව පැහැදිලිය. එය ''අලි කොටි'' ගිවිසුම ලෙස අර්ථ ගැන්වී ඇත. මුළු ජනතාවටම හොරෙන් ''රනිල් ප්‍රභා'' සමග අත්සන් කළේ ඒ ''සටන් විරාම ගිවිසුමය''.

එදා රනිල් මේ ගැන වචනයක් ජනතාවට හෙළි කළේ නැත. එවැනි තත්ත්වයක් තුළ ඔහු අද මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට ''මහින්ද - ප්‍රභා ගිවිසුම'' හෙළි කරන ලෙස ප්‍රකාශ කරන්නේ ඇඳුම් ඇඳගෙනද යන ප්‍රශ්නය අප හමුවේ පැන නගිනු ඇත.

කොටින්ම කිවහොත් ''මහින්ද - ප්‍රභා'' හොර ගිවිසුමක් ගැන කතා කිරීමට රනිල් වික්‍රමසිංහ මහතාට අයිතියක් නැත. මන්ද ඔහුත් එවැනි හොර වැඩක් කර ඇති බැවිනි. අමු අමුවේම හොර වැඩක් කර එය අදත් මහා බේදවාචකයක් බවට පත්වී ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතා නිසාය. එබැවින් හොර ගිවිසුම් ගසා ඇත්තේ මහින්ද ද? රනිල් ද? යන්න ජනතාවට ඉතාම පැහැදිලිය. ඒ ගැන කව්රුවත් අමුතුවෙන් කිවයුතු නැත.

ශ්‍රී ලාල් ප්‍රියන්ත

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් ඕසුරු සංගීතය

ලක් හඬ FM 97

සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

ඔබේ හඬ - ලක් හඬ

නාට්‍යයක් නැරඹීමේදී කථාවස්තුව තුළ නිරූපණය කෙරෙන චරිතවල අමනෝඥ ක්‍රියා දැකීමෙන් ප්‍රේක්ෂකයා තුළ ප්‍රඥාව උදාවන බවත්ල හොඳ නාට්‍යයක් මගින් මිනිසා අවිද්‍යාවෙන් විද්‍යාවට පමුණුවන බවත්ල -ඇරිස්ටෝටල්" නම් පඬිවරයා ශතවර්ෂ ගණනාවකට පෙරාතුව තම කාව්‍ය ශාස්ත්‍රය හමි ග්‍රන්ථයේ ප්‍රකාශකොට ඇතිබව කලකට පෙර කියවූ ලිපියක සඳහන්වූ අයුරු අප මතකයේ ඇත. එය මෙහි සනිටුහන් කලේ ශතවර්ෂ ගණනාවක් මුලුල්ලේ සිට නාට්‍යය නම්වූ අපූර්ව කලා මාධ්‍ය අවධිමත් අධ්‍යාපන ප්‍රවාහයක් ලෙස පැවතූ බවට කියාපෑම සඳහාය.

නාට්‍යයක පරමාර්ථය ප්‍රේක්ෂකයාට පාඩම් ඉගැන්වීමක් නොවනබව සැබෑය. තමා දන්නා හෝ නොදන්නා කතාපුවතක් වේදිකාව මත නළු නිළියන් මවාපාන අයුරු නරඹා චින්දනයක් ලැබීමේ අරමුණින් ප්‍රේක්ෂකයන් ශාලාවට ඇතුළුවන බව අපි දනිමු. නමුත් නාට්‍යකරු මෙහිදී නාට්‍ය රසය ලබාදීමට යොදා ගන්නා ශෛලියල දෙබස්ල උපතුම ආදිය මගින් වක්‍ර ලෙස දැනුම් ප්‍රවාහයක් නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයා වෙත ගෙනයනු ලබයි. ඒ වූකලි අවධිමත් අධ්‍යාපන ප්‍රවාහයක් වන්නේය. ලොව පුරා නාට්‍ය කලාව අධ්‍යාපන මෙවලමක් ලෙස ප්‍රචලිත වූයේ මෙම කලාව තුළ ඇති අධ්‍යාපනික ගුණය නිසාය.

අධ්‍යාපනය සඳහා නාට්‍ය

අධ්‍යාපනය සඳහා නාට්‍ය යනු පංති කාමරයේ උගන්වන විෂය කරුණු වඩාත් කාවදින ලෙසත් පහැදිලි ලෙසත් අවබෝධ කරලීමට නාට්‍ය මාධ්‍ය භාවිතා කිරීමය. මේවාගි මූලික පරමාර්ථය වනුයේ

චින්දනය ඔස්සේ ඉගෙනුම් එලයක් ලබා දීමය. විද්‍යාවල භූගෝලයල ඉතිහාසය ආදී බොහෝමයක් විෂයන් ළමයා වෙහෙසට පත් නොවන අයුරින් රසවත් කරලීමෙන්ල අවබෝධ කරලීමෙන් නාට්‍යමය ආකාරයෙන් යම් යම් අවස්ථා මවා පෙන්විය හැකිය. බොහෝමයක් බරගිරි රටවල අධ්‍යාපන දෙපාර්තමේන්තු සමග ප්‍රවීණ නාට්‍යකරුවන් සම්බන්ධ වී පාසල් පාඨමාලාවලට අනුකූලව නිර්මිත නාට්‍ය පංතිකාමර වෙත ගෙනයාම බහුලව සිදුවන්නකි.

ලාංකික අපට ඒ අත්දැකීම සමීප නොවන්නකි. එහෙත් පාසල් සහ විශ්වවිද්‍යාලවල විෂයමාලාවනට අනුව යම් යම් නාට්‍ය පෙළ හැදෑරීමට සිදුවීම හුරු පුරුදු දෙයකි. එහෙයින් පරිපූර්ණ නාට්‍යමය රසයක් ලැබීමේ හැකියාව නොතිබුනද අඩුතරමින් නාට්‍යමය පෙළක් පංති කාමරයක අත්පොතක් වීමෙන් ශිෂ්‍යයකු ලබන ප්‍රතිලාභය ගැන අදහස් දක්වමු. නාට්‍යකරු වූකලි මනෝවිද්‍යාඥයකු මෙන් ජීවිතයේත් සමාජයේත් විවිධ ගැටලු අධ්‍යයනය කර විනිවිද දැක අපූර්වත්වයකින් යුතුව ප්‍රතිනිර්මාණය කරන්නෙකි. එය නාට්‍යයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමේ මුළුම පියවර නාට්‍ය පෙළය. අපූර්ව භාෂා නිර්මාණයක් වන නාට්‍ය පෙළ අතිෂය ශාස්ත්‍රීය කටයුත්තක් වන්නේය. එය සාමාන්‍ය මිනිසා පිළිබඳව ඔවුන් නොදකින දෘෂ්ටිකෝණයකින් යුතුව විවරණය කරන්නක් වන්නේය. මෙවන් විවරණයක් සහිත පිටපතක් කියවීමෙන් ලබන දැනුමත් රසනිෂ්පත්තියත් මත අපූර්වත්වයක් ලැබිය හැකිය. එසේම මෙතෙක් නොවූ බුද්ධ ප්‍රබෝධයක් ජනිත වන්නේය. සාර්ථක නාට්‍ය පිටපතක් වුවද අධ්‍යාපන කාර්යයක් වන්නේ එනිසාවෙනි.

ළමයින් රඟන නාට්‍ය

මේ වූකලි සුභ අරමුණු රාශියක් සාක්ෂාත් කරගත හැකි මාධ්‍යයකි. ළමයාගේ භාෂා වර්ධනයල චින්දනයල ඉවසීමල පරිකල්පනයල සාමූහිකබවල නායකත්වයල නිර්මාණාත්මක බව ආදී බොහෝමයක් ප්‍රදේශයන් වැඩි දියුණු කරගැනීම උදෙසා ඉමහත්සේ ඉවහල් වන්නකි.

නිතර්කයෙන්ම මෙවන් නාට්‍ය තුළින් ප්‍රතිලාභ ලබනුයේ ප්‍රේක්ෂකයාට වඩා රංගපාන ළමයා ය. ඒ කෙසේදැයත් නාට්‍යයේ ඉදිරිපත්වන අවස්ථා සහ චරිත අවබෝධ කරගැනීමට ළමයා ගන්නා උත්සහය මගින් සමාජය සහ මිනිසා පිළිබඳව ළමයා දැනුවත් වීමෙනි. මිනිසාගේ දුක සතුට සිතුම්පැතුම් අවබෝධ කර ගැනීමට ඔහුට හැකිවීමෙනි. කලින් ලිපිවලඳ සඳහන් කල නවසිළුන්තයේ වෙළිංටන් නුවරදී අප විසින් මෙහෙය වන ලද ළමා නාට්‍ය වැඩමුළුවේ යම් නිදසුන් කීපයක් කියාපාමින් තවත් කරුණු විග්‍රහ කරමු

වරෙක වැඩමුළුව සඳහා වයස අවුරුදු 12ක පිරිමි ළමයෙකු එක්විය. ඔහු ශාලාවට ඇතුළු ව විනාඩි කිහිපයක් යත්ම තරමත් මුරණ්ඩු චරිතයක් බව අපට පසක් විය. කිසිවිටෙක අනෙකෙකුගේ වචනයකටල අදහසකට ඇහුම්කන් දීමට ඔහු මැළිවිය. ඉවසීම ඔහුට අමතක වී තිබූ වචනයක් විය. සැමවිටම තමා හරි යන හැඟීමෙන් යුතු අයෙකු විය. නමුත් නාට්‍ය වැඩමුළුව තුළදී නාට්‍ය පුහුණුවීම වලදී අදහස් හුවමාරු කරගැනීමට සිදුවීමෙන්ල සාමූහිකව වැඩ කිරීමට සිදුවීමෙන්ල තමා කැපීපෙනීමට හිතර දැරූ උත්සහයන් අතැළු බොහෝමයක් ඔහු තුලවූ දුර්වලකම් ඔහුටද නොතේරීම මගහැරී ගියේය. ඔහු අන් මිතුරන්ගේ අදහසට කන්දීමට හුරුවිය. ඔහු තුළ ඉවසීම පුහුණුවිය. මාස කිහිපයකට පසුව ඔහු කණ්ඩායමේ ප්‍රවලිත සාමාජිකයෙකු බවට පත්විය.

නාට්‍යයක සංවාද අවබෝධ කරගැනීම මගින් භාෂා ඥානය වර්ධනය වනු ඇත. අප වැඩමුළුවේ සිටි අල්ප ලෙස සිංහල භාෂාව භාවිතවන පරිසරයක වූ ළමුනට භාෂා ඥානය පුළුල් කරගැනීමටත් නිසි උච්ඡාරණයන් හුරුවීමටත් එය සොඳුරු පාසලක් විය. අප නොකියව මේ සාධක කියාපානුයේ ප්‍රතිඵල අත්විඳි අය ලෙසිනි.

නාට්‍ය සඳහා උපයෝගි කරගන්නා අනෙකුත් අංග නැටුම්ල සංගීතයල ආංගරචනාල වේදිකා සැරසිලි නිර්මාණ ආදිය ගැන දැනුම ළමයා පෝෂණය කරණ සුළු විය. ගායනයල වාදනයල නර්ථනය වැනි ක්ෂේත්‍රයන් කෙරෙහි ළමයාගේ රුචිය වර්ධනය කරවිය. තවත් ළමයකු වැඩ මුළුවට සම්බන්ධ වූ දිනයේ සිට නර්ථනයට ඉතාම අභිරුචියක් විදහා පෑවේය. පසුකාලීනව නිර්මිත නාට්‍යක චරිතයකට පණ පෙවූ ඔහු චරිතයට අදාල නර්ථනයන් ඉතා සාර්ථකව ඉදිරිපත් කලේ නර්ථනයට ඔහුතුළ රුචියද වර්ධනය කරගතිමින්ම ය.

නාට්‍යයේ එන චරිතයන් නිරූපණය කිරීම වූකලි ළමයාගේ පෞරුෂය වර්ධනයට පිටුවහල් වන සාධකයකි. වේදිකාව මතල ප්‍රේක්ෂාගාරයක් ඉදිරිපිට රඟපෑම ළමයා තුළ ආත්ම විශ්වාසය වඩවන්නකි. මෙහිදී අප මතකයට එන තවත් අත්දැකීමක් කියා පාමු. පස් වසකට පෙරාතුව වෙළිංටන්හිදී වැඩමුළුව ඇරඹූ මොහොතේ මවක් සිය පුතණුවන් සමග අපවෙත පැමිණියේය. හින්දෑරී පිරිමි ළමයකු අප වෙත විදහා පා අයය මෙසේ පැවසීය.

-අනේ මේ ළමය කිසිදේකට යන්නෙ නැහැ. ගෑණු ළමයෙක් වගේ. පුළුවන්නං ඔයාලගෙ නාට්‍යකට හරි සම්බන්ධ කරගන්ඩ"

මව කියූදෙය සත්‍යබව අපට වැටහුනේ අපි ඔහු සමග කතා කිරීමට උත්සහගත් විටය. ඔහුට මුහුණාට මුහුණාලා සිටි අපට ඔහු කියූ දෙය නෑසෙන තරමිය. ඔහු තුළ ප්‍රසන්න සිතගවක් තිබුනද ලැජ්ජාවෙන් ඇඹරෙනසුළු විය. අපි ඉතා අශාවෙන් ඔහුට වැඩමුළුවට ආරාධනා කළෙමු.

මාස කිහිපයක් ගතවෙත්ම ඔහුතුළ වූ නිර්මාණශීලි පුද්ගලයකු එළිදැක්කේ අප ඉතාම සතුට කරවමිනි. 2002 වසරේ අප නිෂ්පාදිත -ගැමි රාගබෙල" වේදිකා රංගයේ දාමරිකයකුගේ චරිතයකට පණපෙවූ ඔහුගේ හඬ ශාලාව පුරා දෝංකාර දුන්නේය. වෙස්මුහුණක්ද පැළඳගෙන නොංචි අක්කාගේ චරිතයට පණපෙවූ ඔහුගේ නර්ථනයත් රංගනයත් එක් රැයකින් ඔහු ජන සමාජය තුළ ප්‍රකට කරවිය.

කෙසේ හෝ අප වැඩමුළුවේ පරමාර්ථය වූයේ ප්‍රවීණ නළු නිළියන් බිහිකිරීම නොවිය. බුද්ධියත් ස්වාධීන චින්තනයත් වර්ධනය කරගත් පොරුෂයකින් හෙබි ළමුන් පිරිසක් බිහිකිරීමය. අප කළ අභ්‍යාසයන් (ශාරීරිකව සහ මානසිකව) ළමුන්ගේ යම් යම් වර්යා රටාවන් නොතේරීම හොඳ අතට යොමුකරන සුළු ඒවා විය. තෙවන අසකින් ලෝකය දැකීමට ළමුන් පුහුණු කිරීමක් විය.

විශේෂිත පැතිකඩක්

මේ වූකලි ළමා නාට්‍ය කරණයේ පවතින ප්‍රායෝගික ගැටළුවකි. ඕනෑම ළමා නාට්‍ය නිර්මාපකයෙකු ළමා වයස් සීමාවනට රිසි නාට්‍යයක් නිර්මාණය කිරීමේදී එම වයස් සීමාවේ චින්දනය මුල්කොට ගැනීම සිදුවන්නකි. එහෙත් අප නොසිතන අප විසින් විශේෂ අවධානයක් යොමුකල යුතු පැත්තක් ඇත්තේය.

ළමා ප්‍රේක්ෂකයා තනිව රඟහලට පැමිණෙන්නකු නොව. ඔවුන් කැඳවාගෙන පැමිණෙන දෙමාපියන්ද ප්‍රේක්ෂාගාරයේ අසුන්ගෙන සිටින්නෝය. තම දරුවා නාට්‍ය රස විඳින අයුරු පැයක් හෝ දෙකක් බලාසිටිය නොහැකි දෙමාපියන් නොමැත. එහෙත් දිගින් දිගටම දෙමාපියන් වන අප එය ඉටු කරයිදැරී සිතා බලන්න. ළමයා කැමති රූපවාහිනී ළමා වැඩසටහනක් ඔහු සමග වාඩිවී නිතර නරඹනයේ අපි කීයෙන් කීදෙනාදැරී කෙසේ හෝ ළමයාව ඊට යොමුකර අපි ඉන් ගැලවී නොයයිදැරී ඉතින් මේ විශේෂිත පැතිකඩ ළමා නාට්‍ය කරණයේදී ප්‍රේක්ෂකාගාරය ජය ගැනීමට ඉතා සැලකිලිමත් වියයුතු අංගයක් ලෙස අපි දැකිමු.

මෙය ජය ගැනීම උදෙසා අප අනුගමනය කළ පිළිවෙත වූයේ ළමා නාට්‍යයක් උවද එය වැඩිහිටියන්ටද රසවිඳිය හැකි නිර්මාණයක් ලෙස එළිදැක්වීමට වෙර දැරීමය. ඒ උදෙසා ඒ ඒ නාට්‍ය කරුගේ දැරීක්ෂතාවය මත විවිධ වූ උපක්‍රම භාවිතා කළ හැකිය. -ඔක්කෝමල්ල කොල්ලකාලා" -අපේ කුරුළුගම" -තොප්පි වෙළෙන්දා" සහ -මහදැහ මුත්තා" ආදී අප නිර්මිත සෑම ළමා නාට්‍යකදීම මෙම කරුණ ජය ගැනීමට අප වෙර දැරීය. එසේම ලැබූ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත අපේ ප්‍රයත්නයන් බොහෝ දූරට සාර්ථක වූ බවද පසක් විය.

ඉතා පුටුවල් විෂයක් වූ ළමා නාට්‍ය කරණයේ සුළු හරස්කඩක් කරලිය තුළින් ඔබ හමුවේ විදහා පෑමට උත්සහ දැරූ අපේ ලිපි පෙළ මින් අවසන් කරළමු. මීලඟ කලාපයේ තවත් අළුත් මාතෘකාවක් තුළින් කරලිය පෝෂණය කරලීමේ අපේක්ෂාවෙන් සමුගනිමු.